# වෙස් මුහුණේ සන්නිවේදනාර්ථ

(කෝලම් සහ දහඅට සන්නිය ඇසුරෙන් කරන අධ්‍යයනයකි)

ටී.එස්.එස්.වයි.ගුණවර්ධන

FGS/M/MSSC/2005/09

සමාජීය විද්‍යාපති පාඨමාලාව - ජන සන්නිවේදනය

කැළණිය විශ්ව විද්‍යාලය

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 676 |
| වර්ග අංකය | |

2008

## සාරාංශය

වෙස් මුහුණු සන්නිවේදනයේ ප්‍රභවය දෙස විමසා බැලීමේදී ප්‍රාග් ඓතිහාසික යුගය විශේෂ වේ. යුද්ධය, දඩයම මෙන්ම දෙවිවරුන්, මළවුන්, යක්ෂයින්, ප්‍රේතයින්, ලෙඩරෝග, වැස්ස, නියග වැනි හේතූන් අර්ථ ගැන්වීම සඳහා ඒ ඒ අර්ථයට අනුව වෙස් මුහුණේ සන්නිවේදනය යොදාගෙන ඇත. ලෝක ඉතිහාසය තුළ බොහෝ අවස්ථාවලදී විවිධ සන්නිවේදනාර්ථයන් උදෙසා වෙස් මුහුණ භාවිතා කර ඇත.

වෙස් මුහුණ මගින් නිරූපනය වන සන්නිවේදනාර්ථ නිර්මාණාත්මක මෙන්ම භාෂාමය, අන්තර් සංස්කෘතිකමය, ආගමික හා ජනශ්‍රැති සම්බන්ධයෙන් බොහෝ අර්ථයන් සමාජය වෙත ගෙනහැර පාන්නේය. හාස්‍ය, උපහාසය , රෝග නිවාරණය වැනි බොහෝ හේතු කාරණාවන් මත අතීතයේ සිට වෙස් මුහුණ සන්නිවේදනාත්මක අංගයක් ලෙස භාවිතා වී ඇති බව ජනකලාවන්, ශාන්තිකර්මයන් ආශ්‍රයෙන් පැහැදිලි වේ.

කෝලම් වෙස් මුහුණු මගින් සන්නිවේදනාර්ථ බොහොමයක් සමාජය වෙත දීගහැරේ. දහනව වන සියවසේ මුල් භාගයේ පටන් පැවත එන කෝලම් නාටක කලාව වෙස් මුහුණු පැලඳීමෙන් හාස්‍ය , උපහාසය මගින් ද විවධ වූ සන්නිවේදනාර්ථයන් ලබාදෙයි. ඒ මගින් සමාජයට අවබෝධයක් ලබාදීම ද මෙහිදී සිදුවන මනා සමාජ කර්තව්‍යය වේ.

කෝළම් වෙස් මුහුණු මෙන්ම මෙහිදී දහ අට සන්නියේ එන වෙස් මුහුණු ද විශේෂ වන්නේය. වා, පිත්, සෙම් යන තුන්දොස් නිවාරණය කර ඒ මගින් සෙත් ශාන්තිය ලබා ගැනිම අරමුණු විය. මේ අයුරින් යකුන්ට අදාල වන රෝග ලක්ෂණ ඉස්මතු කරන ලෙස වෙස් මුහුණු පැළඳීම සිදු කරයි. වෙස් මුහුණු සඳහා යොදා ගෙන තිබෙන වර්ණයන් අනුව ද විවිධ වූ සන්නිවේදන අර්ථයන් ලැබේ.

ජන කලාවන් අතර කැපී පෙනෙන වෙස් මුහුණු කලාව දෙස අධ්‍යයනයක යෙදීමේදී බොහෝ තොරතුරු අපට ලබා ගත හැකි අතර ඒ මගින් ඔප්නැංවෙන සන්නිවේදන අර්ථයන්ද බොහෝ ඇති බව පැහැදිලිය. එම සන්නිවේදනාර්ථයන් අද සමාජයට ද උචිත වන ආකාරයට නිර්මාණය කර ඇති නිසා කාලෝචිත, නිර්මාණාත්මක කලාවක් ලෙස වෙස් මුහුණු කලාව හැඳින්වීමට හැකිය.